
# ආර්ථික විද්‍යාව

## 12 ශ්‍රේණිය




## 01 ආර්ථික පද්ධතියක මූලික ආර්ථික ප්‍රශ්න හා ඒවා විසඳා ගන්නා විකල්ප ක්‍රම

1.1 :- ආර්ථික විද්‍යා විෂය ක්ෂේත්‍රය පරීක්ෂා කරයි.

1.2 :- භාණ්ඩ හා සේවා පරිභෝජනයෙන් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් වන ආකාරය පෙන්වා දෙයි.

## 1.1 :- ආර්ථික විද්‍යා විෂය ක්ෂේත්‍රය පරීක්ෂා කරයි.

### ආර්ථික විද්‍යාව පිළිබඳව ඉදිරිපත් වී ඇති නිර්වචන

***ආර්ථික විද්‍යාව යනු විකල්ප භාවිත සහිත් හිඟ සම්පත් භාවිත කරමින් මිනිස් වුවමනා සපුරා ගැනීමේදී, මිනිසුන්ට හැසිරෙන ආකාරය අධ්‍යයනය කෙරෙන විද්‍යාව වේ.***

"ආර්ථික විද්‍යාවේ ස්වභාවය සහ වැදගත්කම පිළිබඳ රචනයක් "

ලයනල් රොබින්ස් (1898-1984))

***ආර්ථික විද්‍යාව වනාහී විකල්ප භාවිත ඇති හිඟ සම්පත්, විවිධ භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදා ගැනීමත්, වර්තමාන හා අනාගත පරිභෝජනය සඳහා සමාජයේ විවිධ පුද්ගලයින් හා කණ්ඩායම් අතර ඒවා බෙදා හැරීමත්, යන කරුණු පිළිබඳව මිනිසුන් සහ සමාජය තේරීම් කරනු ලබන්නේ කෙසේද යන්න පිළිබඳ අධ්‍යයනය යි.***

නූතන ආර්ථික විද්‍යාඥයන්

ආර්ථික විද්‍යාව පිළිබඳ පොදු නිර්වචනයක් පහත පරිදි ඉදිරිපත් කළ හැකි ය.

***විකල්ප භාවිත සහිත හිඟ සම්පත් හා අසීමිත මිනිස් වුවමනා අතර සම්බන්ධතාව අධ්‍යයනය කරන විෂය ආර්ථික විද්‍යාව යි.***

### ආර්ථික විද්‍යාව විද්‍යාවකි

ආර්ථික විද්‍යාවෙහි අවධානයට බඳුන් වන විවිධාකාර වූ ආර්ථික න්‍යාය හා මූලධර්ම විද්‍යාත්මක ක්‍රමවේද අනුව ගොඩනැගී ඇති බැවින්, ආර්ථික විද්‍යාව විද්‍යාවක් සේ සැලකේ.

### ආර්ථික විද්‍යාව සමාජ විද්‍යාවකි

සමාජ විද්‍යාවන් පුද්ගලයන්ගේ හා සමාජයේ ක්‍රියා ක්‍රියාකාරකම් සහ චර්යාවන් පැහැදිලි කිරීමට සහ විශ්ලේෂණය කිරීමට යොමුව පවතී. ආර්ථික විද්‍යාව අවධානය යොමු කරණුයේ පුද්ගලයන්ගේ හා සමාජයේ ආර්ථිකමය හැසිරීම් හා ආර්ථික සංසිද්ධීන් පැහැදිලි කිරීම, විශ්ලේෂණය කිරීම සහ පුරෝකතනය කිරීම යන කාර්යයන් කෙරෙහිය.

මිනිස් සමාජයේ ඉතා පුළුල් විෂය පරාසයක් ආර්ථික පැතිකඩ හා සම්බන්ධ වන අතර, මිනිසා මුහුණ දෙන දූවෙන ප්‍රශ්න රාශියක් ආර්ථික ස්වරූපයක් ගනී. මේ නිසා ආර්ථික විද්‍යාව තරම් ජන ජීවිතයට සමීප තවත් විෂයයක් නොමැති තරම් ය. සමාජීය විද්‍යාවන් අතර රැජින ලෙසින් ආර්ථික විද්‍යාව සැලකෙන්නේ ද මේ නිසා ය.

ආර්ථික විද්‍යාවේ දී අධ්‍යයනයට ලක් වන ආර්ථික පැතිකඩ යන්නෙන් අදහස් වන්නේ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය, හුවමාරුව, පරිභෝජනය හා සම්බන්ධ මිනිස් හැසිරීම් ය.

### ආර්ථික විද්‍යාව ඉගෙනීමේ වැදගත්කම

1. රාජ්‍ය පාලනයේ දී වැදගත් වීම
2. සාර්ථක පුරවැසියකු ලෙස කටයුතු කිරීමට වැදගත් වීම
3. ආර්ථික සංසිද්ධි වඩාත් හොඳින් තේරුම් ගැනීමට වැදගත් වීම
4. ආයෝජකයන්ට, පාරිභෝගිකයන්ට සහ නිෂ්පාදකයන්ට කාර්යක්ෂම තීරණ ගැනීමේ දී වැදගත් වීම
5. ඡන්ද දායකයන්ට සිය ඡන්දය භාවිත කිරිමේ දී වැදගත් වීම
6. පාසල් ශිෂ්‍යයන්ට තාර්කික ව සිතා තීරණ ගැනීමට වැදගත් වීම
7. පුද්ගලයකුට වඩාත් හොඳ රැකියාවක් තෝරා ගැනීමේ දී වැදගත් වීම

## යථානුරූපී හා අභිමථානුරූපී ප්‍රකාශ අතර වෙනස

### *යථානුරූපී ප්‍රකාශ*

කුමක් ද, කුමක් වූයේ ද, කුමක් වනු ඇත් ද ආදී ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා යොමු වූ සහ ප්‍රකාශයේ නිරවද්‍යතාව පරීක්ෂාවට ලක් කළ හැකි ප්‍රකාශ යථානුරූපී ප්‍රකාශ නම් වේ. එබඳු ප්‍රකාශයක නිරවද්‍යතාව සැබෑ ලොව කරුණු ඇසුරින් පරීක්ෂාවට ලක් කොට බැලිය හැකි ය. බොහෝ ආර්ථික න්‍යායන් මගින් පැහැදිලි කෙරෙන්නේ ද යථානුරූපී පක්‍රාශයන් ය. එසේ ම යථානුරූපී ප්‍රකාශයන්හි දැඩි ලෙස විෂයානුබද්ධ බවක් ද පවතී.

උදා : 2019 වර්ෂයේ සාමාන්‍ය පෙළ සමත්වීමේ ප්‍රතිශතය 65% කි.
හාල් මිල ඉහළ යන විට සහල් ඉල්ලුම අඩු වේ.

### *අභිමතානුරූපී ප්‍රකාශ*

සමාජය තුළ පැවතිය යුත්තේ කුමක් ද , සිදු විය යුත්තේ කුමක් ද යන්න පිළිබඳ ව ඉදිරිපත් වී ඇති ප්‍රකාශ අභිමතානුරූපී ප්‍රකාශ ය. මේවා බොහෝ සෙයින් ම පුද්ගල බද්ධ වේ. සැබෑ ලොව දත්ත ඇසුරෙන් විෂයබද්ධ ව අභිමතානුරූපී ප්‍රකාශවල සත්‍යාසත්‍ය බව පරීක්ෂා කිරීම අපහසු ය.

උදා : පසුගිය වසරේ සාමාන්‍ය පෙළ ප්‍රතිඵල යහපත් මට්ටමක පවතී
ආදායම අසමාන ලෙස බෙදී යාම අසාධාරණ වේ.

## පහත ප්‍රකාශ යථානුරූපී හා අභිමථානුරූපී ප්‍රකාශ දැයි දක්වන්න.

මුදල් සැපයුම සහ මිල මට්ටම අතර අනුලෝම සම්බන්ධතාවක් පවතී.

.......................................................................................................................

මිලත් ඉල්ලුම් ප්‍රමාණයත් අතර ප්‍රතිලෝම සම්බන්ධතාවක් පවතී.

.......................................................................................................................

සැම රාජ්‍ය සේවකයකුගේ ම මාසික වැටුප රුපියල් 5000කින් වැඩි කළ යුතු ය.

.......................................................................................................................

සැම පුරවැසියකුට ම නොමිලේ වෛද්‍යාධාර ලබා දීම සුදුසුය.

.......................................................................................................................

2019 වර්ෂයේ ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති අනුපාතිකය 4.4%ක් විය.

.......................................................................................................................

ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධන අනුපාතිකය 1%කි.

.......................................................................................................................

ශ්‍රී ලංකාව සංවර්ධනයට විදේශාධාර ලබා ගැනීම යෝග්‍ය නොවේ.

.......................................................................................................................

සැම පුද්ගලයකුට ම සමාන ආදායමක් ලැබීම අසාධාරණ වේ .

.......................................................................................................................................

ශ්‍රී ලංකාවේ ආර්ථික වෘද්ධි වේගය 8% මට්ටමේ පවත්වා ගත යුතු ය.

.......................................................................................................................................

ආර්ථික විද්‍යාව හදාරණ සිසුන් අවංක සිසුන් වේ.

.......................................................................................................................................

## සූක්ෂම ආර්ථික විද්‍යාව හා සාර්ව ආර්ථික විද්‍යාව අතර වෙනස

### *සූක්ෂම ආර්ථික විද්‍යාව*

ආර්ථිකය සමන්විත වී ඇති එක් එක් අංශ, ආයතන, පුද්ගලයන් සහ ආර්ථික විචල්‍ය ආදි කුඩා ඒකක වෙන් වෙන් වශයෙන් ගෙන ඒවායේ හැසිරීම අධ්‍යයනය කිරීම සූක්ෂම ආර්ථික විද්‍යාව ලෙස හැඳින්වේ.

උදා : භාණ්ඩයක ඉල්ලුම හා සැපයුම

හිගකම, තේරීම, ආවස්ථික පිරිවැය

### *සාර්ව ආර්ථික විද්‍යාව*

සාර්ව ආර්ථික විද්‍යාවෙන් ආර්ථිකයේ සමස්ත ආර්ථික ඒකක හෝ විචල්‍යයන්ගේ ක්‍රියාකාරිත්වය අධ්‍යයනය කෙරේ.

උදා : මිල මට මට්ටම

දළ දේශීය නිෂ්පාදිතය

## පහත සංකල්ප සූක්ෂම ආර්ථික විද්‍යාව හා සාර්ව ආර්ථික විද්‍යාව දැයි දක්වන්න.

ආයතනයක නිෂ්පාදන පිරිවැය

.......................................................................................................................................

එක් එක් භාණ්ඩවල වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය

.......................................................................................................................................

සමස්ත නිමැවුම් මට්ටම

.......................................................................................................................................

ආර්ථික උත්පාත හා අවපාත

.......................................................................................................................................

ව්‍යාපාර ආයතනයක වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය

.......................................................................................................................................

ආර්ථික පසු බෑසීම

.......................................................................................................................................

ගෙවුම් ශේෂය

.......................................................................................................................................

හිඟකම

.......................................................................................................................................

ආවස්ථික පිරිවැය

.......................................................................................................................................

උද්ධමනය

.......................................................................................................................................

යම් භාණ්ඩයක ඉල්ලුම, සැපයුම, මිල තීරණය වීම

.......................................................................................................................................

විරැකියා මට්ටම

.......................................................................................................................................

**පහත ප්‍රකාශ සූක්ෂම හෝ සාර්ව ආර්ථික විද්‍යාවට අයත් යථානුරූපී හෝ අභිමතානුරූපී ප්‍රකාශ ද යන්න දක්වන්න.**

පසුගිය වසරේ මූර්ත ද.දේ.නි. 7%කින් ඉහළ ගියේය.

.......................................................................................................................................

අප පාසලේ හොඳම ළමුන් සිටින්නේ වාණිජ අංශයේය.

.......................................................................................................................................

ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රම සහභාගීත්වය යහපත් මට්ටමක පවතී.

.......................................................................................................................................

පසුගිය වසරේ අප පන්තියේ ආර්ථික විද්‍යා විෂය අසමත් වූ සිසුන් නොමැත.

.......................................................................................................................................

1. පහත සංකල්පයන්ට උදාහරණය බැගින් දක්වන්න.

I. සූක්ෂම ආර්ථික විද්‍යාව

II. සාර්ව ආර්ථික විද්‍යාව

III. යථානුරූපී ප්‍රකාශ

IV. අභිමතානුරූපි ප්‍රකාශ

V. සූක්ෂම යථානුරූපී ප්‍රකාශ

VI. සාර්ව යථානුරූපී ප්‍රකාශ

VII. සූක්ෂම අභිමතානුරූපි ප්‍රකාශ

VIII. සාර්ව අභිමතානුරූපි ප්‍රකාශ

## 1.2 :- භාණ්ඩ හා සේවා පරිභෝජනයෙන් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් වන ආකාරය පෙන්වා දෙයි.

### භාණ්ඩ

ධන තෘප්තියක් හෙවත් උපයෝගිතාවක් ලබාදෙන ඕනෑ ම දෙයක් ආර්ථික විද්‍යාවේ දී භාණ්ඩයක් ලෙසින් හැඳින්වේ. මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරා ගන්නා භාණ්ඩ

1. ආර්ථික නොවන භාණ්ඩ
2. ආර්ථික භාණ්ඩ

### ආර්ථික නොවන භාණ්ඩ (නොමිල භාණ්ඩ)

ශුන්‍ය මිලක දී **අසමීත සැපයුමක්** සහිත භාණ්ඩ ආර්ථික නොවන භාණ්ඩ වේ. ආර්ථික නොවන භාණ්ඩවල සම්පත් පිරිවැයක් හා **ආවස්ථික පිරිවැයක් නොපවතී.** ආර්ථික නොවන භාණ්ඩවල ප්‍රධාන ස්වරූප 3කි.

1. ස්වභාව ස්වභාව ධර්මයෙන් ලැබී ඇති සම්පත්
2. නිෂ්පාදන ක්‍රියාවලියේ දී බද්ධ නිෂ්පාදනයක් ලෙස නිපදවෙන සම්පත්
3. ශුන්‍ය පිරිවැයක් යටතේ අනුකරණය හා ප්‍රති නිෂ්පාදනය කළ හැකි අදහහස් හා නිර්මාණ

### ආර්ථික භාණ්ඩ

සැපයුමෙහි **හිඟකමක්** දක්නට ලැබෙන භාණ්ඩ ආර්ථික භාණ්ඩ වේ. ආර්ථික භාණ්ඩවල සම්පත් පිරිවැයක් හා **ආවස්ථික පිරිවැයක්** පවතී.

උදා : ආහාර, ඇඳුම්, මෝටර් රථ, ගෘහ භාණ්ඩ

ආර්ථික භාණ්ඩ කිසි විටෙකත් ආර්ථික නොවන භාණ්ඩ බවට පත් නොවුණ ද ආර්ථික නොවන භාණ්ඩ ආර්ථික භාණ්ඩ බවට පත්වන අවස්ථා පවතී.

| ආර්ථික නොවන භාණ්ඩ | ආර්ථික භාණ්ඩ |
|---|---|
| ස්වභාවධර්මයෙන් ලැබෙන වාතය | කිමිඳුම්කරුවකු කිමිදීමේ දී භාවිත කරන ඔක්සිජන්<br>රෝගියකුට ලබාදෙන ඔක්සිජන් |
| උල්පත් ජලය | බෝතල් කරන ලද ජලය |
| ගඟ | වැව |
| කැලේ සිටින වන සතුන් | බර ඇදීමට යොදා ගන්නා හීලෑ සතුන් |
| හිරු එළිය | සූර්ය බලයෙන් නිපදවන සූර්යකෝෂ<br>හිරු එළියෙන් වියළා ගන්නා රෙදි |

### නීච භාණ්ඩ

ඍණ තෘප්තියක් හෙවත් අනු උපයෝගීතාවක් ලබාදෙන භාණ්ඩ වේ. මෙම භාණ්ඩ පරිභෝජනයෙන් ඉවත් කර දැමීමට පිරිවැයක් දැරීමට කැමති වේ.

උදා : කුණු කසල, වල් පැලෑටි

දුම්වැටි, මත්පැන් යනාදිය නීච භාණ්ඩ නොවේ. ඒවා ආර්ථික විද්‍යාවේ දී අවගුණ භාණ්ඩ ලෙස හැඳින්වේ. ඒවායින් යම් කෙනකුට උපයෝගීතාවක් ලැබෙන අතර සමාජයට අහිතකර ප්‍රතිඵල අත්කර දේ .

**පහත භාණ්ඩ ආර්ථික භාණ්ඩ ද ආර්ථික නොවන භාණ්ඩ ද යන්න දක්වන්න**

1. ඊශාන දිග මෝසම් වර්ෂාව -
2. පරාක්‍රම සමුද්‍රය -
3. නොමිලේ ලැබෙන නිල ඇඳුම් -
4. සංචාරක ආකර්ෂණය කින් යුත් දිය ඇලි -
5. ඛනිජ නිධි -
6. කඳුකරයේ තේ වගාව -
7. කැලයෙන් කපාගෙන එන දර -
8. රෙදි වේලීමට ගන්නා හිරු එළිය -
9. හිරු එළියෙන් වියළා ගන්නා රෙදි -
10. මැණික් පතල -
11. වායුගෝලයේ ඇති කාබන්ඩයොක්සයිඩ් -
12. ආබාධිත රණවිරුවන්ට ලබා දෙන සුබසාධන භාණ්ඩ -
13. සංචාරක ආකර්ෂණයට ලක්ව ඇති හුම්මානය-
14. මහජන සම්පත ලොතරැයියෙන් පිරිනැමුණු සුබෝපභෝගී මෝටර් රථය -
15. ලී බඩු නිෂ්පාදන සමාගමක් සතු තේක්ක දැව තොගය -
16. ගැබිණි මව්වරුන්ට ලබා දෙන පෝෂණ මල්ල -
17. මිදුලේ ඇති කුඹී ගුලක් -
18. නිලාවේලි මුහුදු තීරය -

**පහත ප්‍රකාශ සත්‍ය අසත්‍යතාවය දක්වන්න.**

I. පාරිභෝගිකයන්ට (-) උපයෝගීතාවයක් ලබා දෙන භාණ්ඩ ආර්ථික නොවන භාණ්ඩ වේ. (     )

II. covid 19 එන්නත් නොමිලේ ලැබෙන බැවින් එය නොමිල භාණ්ඩයකි. (     )

III. බීමට සුදුසු පානීය ජලය නාගරික ජනතාවට ආර්ථික භාණ්ඩයකි. (     )

IV. යතානුරූපී ප්‍රකාශ පදනම් කරගනිමින් ආර්ථික න්‍යායන් ගොඩ නගනු ලැබේ. (     )